නුවනත විද්‍යුත් සිංහල සඟරාව
වෙළුම 01, 2022, 73 - 81
සිංහල අධ්‍යයනාංශය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය

# "අදිසි" නදිය නවකතාව පිළිබඳ ව විචාරයක්

කපිල කුමාර කාලිංග විසින් රචිත **අදිසි නදිය** නම් කෘතිය 2019 වර්ෂයේ ස්වර්ණ පුස්තක සම්මානිත නවකතාව යි. මීට අමතර ව ඔහු විසින් රචනා කරනු ලැබූ කතා ලෙස **පියැසි කවුළුව, කන්දේ වීදිය** හා **සැප්තැම්බරයේ දිග දවසක්** හැඳින්විය හැකි ය. කපිල කුමාර කාලිංගගේ කතාවල විශේෂත්වය වන්නේ පාඨකයා සිංහල නවකතාවට නුහුරු විෂය භූමියකට කැඳවා ගෙන යාම යි.

බැලූ බැල්මට ත්‍රාසජනක වූ නදියක අභිරහස් කතාවක් ලෙස පාඨකයා අතරට එන මෙම නවකතාවේ අරමුණු බොහෝමයක් දක්නට ලැබෙන බව සිතිය හැකි ය. කතුවරයාගේ මෙම නවකතාවට පාදක වී තිබෙන්නේ සමාජයෙහි පවතින එක් ප්‍රබන්ධ කතාවකි. එය සත්‍ය හෝ අසත්‍ය වේ දැයි කිසිවෙකු දන්නේ නැත. එහෙත් මෙම නවකතාවෙන් ඒ පිළිබඳ ව මිනිසා හා සමාජයේ කතිකාවතක් ඇති කිරීම, කුතුහලයක් දැනවීම අපේක්ෂා කරන්නට ඇතැයි නිගමනය කළ හැකි ය. කතුවරයාට මෙම නවකතාව නිර්මාණය කිරීමට සාධක වී තිබෙන්නේ මාතලේ නගරය යටින් ගංගාවක් ගලා ගෙන යන බව හා එම නගරය යම් දවසක ගිලා බැස විනාශයට පත් වේ යැයි පවතින කතිකාවත යි. එය කතාව ආරම්භයේ දී ම "උල්පත" නම් කොටසෙහි දක්වා ඇත.

"මාතලේ නගරයේ යටින් ගලා බස්නා භූගත ගංගාවක් ඇති බැවින් මතු යම් දවසක එම නගරය ගිලා බැස විනාශයට පත් වනු ඇතැයි කතාවක් පවතී. එසේ ම කඳුකරයේ දුම්රිය නගරයක් ආසන්නයේ ඇති කන්දක් නාය යාමෙන් කිසියම් දිනක නගරය සහමුලින් වැසී වැනසී යනු ඇතැයි ද විශ්වාසයක් ඇත..."

"...කෙසේ වෙතත් බාල වියේ සිට අසා තිබූ මෙම ජනප්‍රවාදයන් මා තුළ ඇති කළ කුතුහලය කාලය සමඟ ගැටෙමින් අඩු වැඩි වෙමින් පැවතුණි. අදිසි නදියට උල්පත වූයේ මෙම කුතුහලය යි... "

කතුවරයාට අදිසි නදිය නවකතාව නිර්මාණය කිරීමට වස්තු බීජය වූ අද්දැකීම ඔහු ම විස්තර කරයි. කෙසේ වෙතත් තමා ලද අද්දැකීම ප්‍රවෘත්තියක් ආකාරයෙන් සමාජගත කරන්නේ නම් එම ප්‍රවෘත්තිය එම දිනයන්ට පමණක් වලංගු වන අතර ඉන් පසු සමාජයට ම අමතක වී යයි. එහෙත් කපිල කුමාර විසින් එය වස්තු බීජයක් කර ගෙන නවකතාවක් පරිද්දෙන් පාඨකයා වෙත ගෙන ඒම හේතුවෙන් එය රස විඳින පාඨකයා තුළ එම මතකය සදා රැඳෙන අමරණීය බවක් ඇති කරයි.

අදිසි නදිය නවකතාවෙහි එක් නගරයක් පිළිබඳ ව කියැවේ. එහෙත් කතුවරයා මෙම නගරයට නමක් හෝ නගරයේ මිනිසුන්ට නම් නොමැති බව ප්‍රකාශ කරයි. මෙම නගරයට පැමිණෙන මැක්ස් එක්සෙල් නම් සංචාරකයාගේ පැමිණීමත් සමග කතාව ආරම්භ කරයි. මෙම නගරයේ මිනිසුන්ට ඔවුනට ආවේණික වූ නමක් තිබුණේ නැත.

9 772950 655005

“පුදුමයකට මෙන් අතීතයේ සිට ම එ නුවර වැසියන්ට ද හරිහමං නම් ගම් නො තිබුණි. ඔවුන්ගෙන් සමහරු අක්ෂර හෝ සංඛ්‍යා නාම වැනි දෑ තමන් හඳුන්වනු පිණිස යොදා ගත්හ. ’’

කතුවරයා මෙම නගරයට හා එහි සිටින පුද්ගලයින්ට නම් නොමැති බව ප්‍රකාශ කිරීමෙන් පාඨකයාට සිතන්නට යමක් එක් කර තිබේ. මෙම නවකතාවෙහි සඳහන් ව ඇත්තේ නම්, ගම් කිහිපයකි. ඔවුන් ද ඒවා අක්ෂර හෝ සංඛ්‍යා නාමවලින් සකසා ගත් ඒවා ය. රෙක්ස්, වැන්, ලිලී, වේටර් ඒ, වේටර් බී, බාර්මන්, ඩෝගී, බෝබෝ, නීනා, ආතර් ආදි සීමිත නම් ප්‍රමාණයක් මෙම නවකතාවේ දක්නට ලැබේ.

මැක්ස් එක්සෙල් නමැති මානව විද්‍යාඥවරයා මෙම නගරයට පැමිණෙන්නේ නගරය පිළිබඳ ඉදිරිපත් වී ඇති අවදානම් සහගත තත්ත්වය මත ය. ඔහුට ලැබී ඇති දත්ත අනුව මෙම නගරය ගිලා බසින්නට ආසන්න බවත්, ඉන් නගර වැසියන් බේරා ගැනීමට අවශ්‍ය බවත් ඔහු සෑම තැනක දී ම ප්‍රකාශ කරන්නකි. එහෙත් මෙම නගරයෙන් කිසිවෙකුට පිට වී යාමට අවස්ථාවක් නොමැත. එම නගරයේ පාලන තන්ත්‍රය විසින් පනවා ඇති අසීමිත වූ නීති රීති මාලාව හේතුවෙනි. මෙම නගරය කිසියම් අවදානම් තත්ත්වයක පවතින බවට එහි පාලකයින් දැනගෙන සිටිය ද ඔවුන් එම ජනතාව බේරා ගැනීමට කිසිදු පියවරක් ගන්නේ නැත. ජනතාව තුළ එම නගරය පිළිබඳ ව ඇති අවදානම් සහගත තත්ත්වය පවා මඟ හැරෙන ආකාරයෙන් අසත්‍ය ප්‍රචාර යවමින් තම බලය පවත්වාගෙන යාමට පාලන තන්ත්‍රය කටයුතු කරයි. ඊට විරුද්ධ වෙන සෑම පුද්ගලයෙකුට ම හිමි වූයේ මරණය හෝ සදා නිදහසක් නොමැති භූගත සිරගෙවල්වල දස වද විඳීම ය. මෙකී තත්ත්වය හමුවේ පාලන තන්ත්‍රයට ඉහළින් යාමට කිසිවෙකුත් කටයුතු නොකළේ තම ජීවිතය ටික කලක් හෝ යහපත් ලෙස ගත කර දැමීමට යි.

"නගරයෙන් පලා යාමට තැත් කළ තරුණයකු වෙඩි පහරින් මරුට. තවත් සිව් දෙනකු අත්අඩංගුවට"

එසේ ම මැක්ස් පුරපති හමු වූ අවස්ථාවේ දී නගරය පිළිබඳ තොරතුරු විමසන විට ඔහු පිළිතුරු දෙන ආකාරයෙන් මේ නගරය මුහුණ දී ඇති අවදානම් තත්ත්වය පිළිබඳ ඔවුන් ගණනකට නොගන්නා බව පැහැදිලි වේ. ඔවුන්ට අවශ්‍ය බලය යොදා ගනිමින්, තම අණසක පතුරවමින් ජනතාව යටත් කරගෙන සිටීම බව ඉන් පැහැදිලි වන්නකි.

“කරුණාකරලා ඒක ඉල්ලා අස්කර ගන්ඩ. මොනවද භයානක, අපි සදාකාලික හරිත නගරයක්. මුළු ලෝක ධාතුව ම විනාශ වුණත් මේ නගරය පවතිනවා. එහෙමයි පුරාණ ග්‍රන්ථවල සඳහන් වෙන්නේ. පොළොව යට ගංගාවක් තියෙනවා නම් ඔහේ තිබුණාවේ. මොකක්ද ඒකේ භයානකකම. මොනවද මේ දොඩවන්නේ’’

**අදිසි නදිය** නවකතාව අද්භූත නවකතාවක් ලෙස හැඟුණ ද නම්, ගම් නොමැති වුව ද එහි ගැබ් ව පවතින්නේ සමාජ යථාර්ථය යි. එනම් සමාජයෙහි පවතින දේශපාලන බලය හේතුවෙන් මිනිසා අත්විඳි ඉරණම යි. තමා ජීවත් වන නගරය විනාශ වන බව දැන දැන ම ඔවුන් ඉදිරි කෙටි කාලයේ දී හෝ සතුටින් ජීවත් වීම අභිලාෂ කරගෙන ජීවත් වන්නේ එහෙයිනි. පාලන තන්ත්‍රයට එරෙහි ව එකදු

කෙළ බිඳක් හෝ නොහළන්නට ඔවුන් වග බලා ගන්නේ එබැවිනි. ඔවුහු තමන්ගේ අදහස් සිත්වල ම රඳවාගෙන දුක් විඳිමින් සිතින් සිරකරුවන් වූහ. ඔවුන්ට සිදු වූයේ තම තමන්ගේ අදහස් පවා රාත්‍රී නින්දට ගිය පසු රහසින් කතා කිරීමට ය.

“මෙවැනි කාලවල දී නගරයේ තැන තැන සවි කර ඇති කටකථා වීමත් යන විමර්ශන ඒකකයේ රහසිගත මයික්‍රෆෝන ක්‍රියාත්මක වන බව ඔවුහු දැන සිටියහ. ඔවුන් තම සිත් තුළ ඇති අදහස් පිට කරගත්තේ නිවසේ නිදන කාමර තුළ දී ය. දෙමව්පියන්ගෙන් දරුවනට පවා නොඇසෙන සේ එය සිදු කෙරුණි.’’

නගරය පත් ව ඇති ඉරණම පාලන තන්ත්‍රය කොතරම් දැනුවත් කළ ද ඔවුන් ඒවා පුරාවෘත්ත හෝ අතීත කතා පමණක් ලෙසින් සලකා කටයුතු කළහ. එසේ ම තම නගරය පිළිබඳ ව පවසා අනෙක් නගරවලින්, විදේශවලින් ආධාර උපකාර පවා ලබා නොගැනීමට වග බලා ගත්තේ තම පාලන බලය අහිමි වේ යැයි බියෙනි. මෙකී කාරණා මගින් පැහැදිලි වන්නේ අපගේ සමාජ යථාර්ථය ම නොවේ ද? නගරයක සිදු වන විපර්යාසයක් ලෙස දැක්වුව ද මෙය වර්තමාන ලාංකේය සමාජයට අත් ව ඇති ඉරණම යි. තම රට විනාශ මුඛයට ඇද දැමුවා වූ තමන්ගේ පාලන බලය අහිමි කර ගැනීමට කවුරුත් කැමති නැත. බලය ධනය හමුවේ ලාංකේය දේශපාලුවෝ පොරකන්නේ එබැවිනි. අප රට ද ගඟකින් හෝ මුහුදකින් ගිලා බැස විනාශ නොවුණ ද අන් සියලු අංගයන්ගෙන් දැනටමත් විනාශ වෙමින් පවතී. මෙකී සමාජ යථාර්ථය ඉහළ නිලතල දරන උන්ගේ දැඩි බව, සෑම අංශයකින් ම තැළෙන පොඩි වන පීඩිත පන්තිය ගැන මෙම කතාවේ එක් පැත්තකින් විවරණය කරයි.

“කෙබඳු තත්ත්වයක් වුව ද, විදේශයන්ගෙන් ආධාර නොලැබිය යුතු බව පුරපතිගේ මතය විය. අපේ ප්‍රශ්න අපිට විසඳගන්න පුළුවන්...ආපදාවක් වුණත් ඒක අපේ දෙයක් හැටියටයි අපි සලකන්නේ’’

මෙහි පාලකයන් නගරවාසීන්ට නීති රීති දමමින් ඔවුන්ගේ රෞද්‍ර පාලනය ගෙන යන්නේ සියල්ලන්ගේ ම ගැටලු විසඳන ආකාරයෙනි. එහෙත් නගරය අනතුරට පත් වූ අවස්ථාවේ ඔවුන් ගත් පිළියම් හිසේ ඇම්මට කොට්ට මාරු කරන්නා වගේ පාඨක මුවඟට සිනාවක් එක් කරන ඒවා ය.

“නගර සභාවේ පළමු පියවර වූයේ සියලු වැසියන්ට සෞඛ්‍ය ආරක්ෂිත මුව වැසුම් භාවිත කරන මෙන් උපදෙස් දීම ය. ඒ සඳහා විශේෂයෙන් නිපදවන ලද මුව මැසූ මධ්‍යස්ථාන කිහිපයක දී පහසු මිලකට නිකුත් කරන ලද අතර ඒ තැන්වල ඉතා දිගු පෝලිම් දක්නට ලැබුණි. ’’

“දුගඳ පැතිර යාමට හේතුව ගැන නොයෙක් කතා පැතිරිණි. සමහරු පැවසුවේ නගරය යටින් දිවෙන මල ප්‍රවාහන පද්ධති පුපුරා යාම නිසා එය සිදු වූවක් බව ය.’’

“දුර්ගන්ධයෙහි යම් අඩුවක් වූයේ නගර සභාව සුවඳ කුඩු විෂ නාසක වාරුවක් හෙලිකොප්ටර් මඟින් නගර අවකාශයෙහි විසුරුවන්නට වූවායින් පසු ව ය.’’

9 772950 655005

''මේ සියලු ගැටලුවලට විසඳුම සංවත්සර උලෙළ මහා ඉහළින් පැවැත්වීම බව නගර සභාවේ අදහස විය.''

පාලකයන්ගේ මෙම ප්‍රාථමික පිළියම් නගර වැසියන්ගේ ජීවිත තව තවත් අවදානමකට ලක් කළ බව පෙනෙයි. කෙසේ වෙතත් මෙම නවකතාවෙහි එන පාලකයන්ගේ හැසිරීම ලාංකේය දේශපාලකයන්ගේ හෙලුව කියාපායි. කපිල කුමාර කාලිංග විසින් රචිත මෙම කෘතියේ දැක්වෙන නමක් නොමැති නගරයේ සිදු වන පාලන ක්‍රමවේදය ලාංකේය දේශපාලන සමාජයේ යථාර්ථය පිළිබිඹු කරන්නට ගත් උත්සාහයක් ලෙස හඳුනා ගත හැකි ය. දේශපාළුවන්ගේ ක්‍රමවේද, බලයට ධනයට ඇති කෑදරකම, යම් ගැටලුවකට පිළියම් කරන ආකාරය ලාංකේය දේශපාලන සමාජයේ සිදු වන අයුරින් ම ප්‍රතිනිර්මාණය කොට තිබේ.

පාලන තන්ත්‍රය පමුණුවන නීති රීති හමුවේ තම සිතැඟි පරිදි ජීවත් වීමට කිසිවෙකුට හැකියාවක් නැත. මොනයම් හෝ පොඩි හේතුවකින් තමන්ට සිරගත වීම හෝ මරණ දඬුවම ලැබීමට සිදු වන බව නගර වැසියෝ දැන සිටියහ. එහි දී රෙක්ස් නමැත්තා එනම් මැක්ස්ට හමු වන අපූර්වත ම මිතුරා එවැන්නෙකි. ඔහු මන්ද මානසික අයෙකු සේ වීදිවල සැරිසරමින් කාලය ගත කරන්නේ එවිට ඔහු ව කවුරුත් ගණන් නොගනිමින් කටයුතු කරන නිසා ය.

''මිනිහගෙ නම රෙක්ස් උනාට මිනිහා අනිත් අයට කතා කරන්නෙත් රෙක්ස් කියලා. ඒත් මේ පළාතේ හුඟ දෙනෙක්ට නම් නැති නිසා කවුරුත් ඒක වැඩිය ගනන් ගත්තේ නෑ. ඉස්සර මිනිහා ගයිඩ් කෙනෙක්. ඒ කාලේ මේ ටවුම ටුවරිස්ට්ලගෙන් පිරිලා. අන්තිමේ දී මිනිහා ඩ්‍රග්ස්වලට ඇබ්බැහි උනා. ඒකෙන් තමයි රෙක්ස්ගේ මොලේ කොලොප්පන් වුනේ''

සත්‍ය ලෙස ම නගරයේ ජීවත් වනවාට වඩා මෙසේ කවුරුත් නොදන්නා පුද්ගලයකු බවට පත් වීමෙන් තමාට එල්ල විය හැකි බලපෑම් අවම ය. කෙසේ හෝ තම ජීවිතය ගැට ගසා ගනිමින් නිදහසේ සිටින්නට ඵ නුවර වැසියෝ උත්සාහ ගත්හ. මුළු නගරය ම විනාශ වන බව මැක්ස් සියලු දෙනාට පවසා සිටිය ද, ඒ පිළිබඳ ව විමසා සිටිය ද ඒ පිළිබඳ ව කතා කිරීමට ඔවුන් උදාසීන බවක් දැක්වූයේ පාලන තන්ත්‍රයට ඇති බිය හේතුවෙනි. තමන්ගේ ජීවත් වීමේ අයිතිය පවා උදුරා ගැනීමෙන් මෙම නගර වැසියන්ට සිදු ව ඇත්තේ වහලුන් සේ තම ඉදිරි දිවිය ගත කිරීමට යි.

එක් අවස්ථාවක මෙම නගරයේ සිරකුටි නැරඹීමට අවස්ථාවක් මැක්ස්ට උදා වේ. ඒ අවස්ථාවේ දී නගරයේ ජීවිත කාලය පුරා ම සිරබත් කමින් ජීවත් වීමට සිදු වූ සිරකරුවන්ගේ ශෝකාලාපය කතුවරයා මනා ව දක්වා තිබේ. මුළු ජීවිත කාලයේ දී ම සිරගත ව සිටීමට එක් පුංචි සිදුවීමක් ප්‍රමාණවත් ය. යම් හෙයකින් සිරගත වූ පුද්ගලයින් නැවත පැමිණියේ නම් ඔවුන් පැමිණෙන්නේ පියවි සිහියෙන් නොවේ. එක් අවස්ථාවක බාර්මන්ගේ ඥාති පුත්‍රයකු සිරභාරයට ගෙන ගොස් තිබුණේ උසස් අධ්‍යාපනය සඳහා අගනුවරට යාමට තැත් කළ නිසා ය. එවන් සුළු සිදුවීම් හේතුවෙන් දිවිය පුරා ම සිර දඬුවම් විඳීමටත්, තම පවුලේ සියලු දෙනාටත් දඬුවම් විඳීමට සිදු වීමත් මෙම නගරයේ ස්වභාවය විය.

9 772950 655005

"අගනුවර මිල්කිවේ මාධ්‍ය විශ්ව විද්‍යාලෙට යන්න තමයි සූදානම් වුණේ... මෙහි මාධ්‍ය මධ්‍ය විද්‍යාල නැහැනේ"

"මේක අපේ පවුල් පිටින් විනාශ වෙන ප්‍රශ්නයක් සර්, නංගිගේ මහත්තයා දැනටමත් ආගිය අතක් නෑ"

මැක්ස් හැකි සෑමවිට ම මෙම විනාශ වීමට නියමිත නගරයෙන් ජනතාව ගලවා ගැනීමට උත්සාහ කරයි. ඔහුට ඒ සඳහා උදව් වන්නට කැමැති වන්නේ කිහිප දෙනෙකි. අනෙක් පුද්ගලයන්ට නගරයෙන් පැන යාමට අවැසි වුවත් පාලන තන්ත්‍රයට ඇති බිය හේතුවෙන් ඊට උදව් කිරීමට පෙලඹෙන්නේ නැත. මැක්ස්ට හමු වන බොහෝ දෙනෙකු පිස්සෙකු යැයි සඳහන් කරන රෙක්ස් මැක්ස්ගේ හොඳ ම මිතුරා බවට පත්වෙමින් නගරයෙන් මිනිසුන් ගලවා ගැනීමේ මෙහෙයුමට සම්බන්ධ වන්නේ තම දිවි පරදුවට තබමිනි.

පැරණි වීදියේ පොත් සාප්පුවක හිමිකාරයකු වූ වැං මැක්ස්ට හමු වන්නේ මැක්ස් පැරණි නගරයේ ඇවිද යද්දී ය. වැං මැක්ස්ට අවශ්‍ය සමහර පැරණි මූලාශ්‍රය ලබා දෙමින් මැක්ස්ට උදව් කරයි. වැංගේ දියණිය වූ ලිලී ද මැක්ස්ට උදව් වන්නේ මැක්ස් පිළිබඳ දැඩි විශ්වාසයකිනි. නගර ආරක්ෂක හමුදාව විසින් කරනු ලබන සෝදිසි මෙහෙයුම්වල දී පවා මැක්ස්ව සඟවා තබා ගෙන ඉන් බේරීමට උදව් කළේ වැං හා ලිලී ය. නගරයේ පැරණි විස්තර මැක්ස් හට කියා දෙමින්, භූගත ලෝකය පිළිබඳ තොරතුරු ලබා දීමට ද වැන්, ලිලී ඉදිරිපත් විය.

නගරයෙන් පලා යා යුතු යැයි යන අදහස සමාජගත කරන්නට මැක්ස් උත්සාහ ගත්තත් අවසානයේ ස්වභාවධර්මයා විසින් ම නගරයේ ජනයා තුළ නගරයෙන් පැන යා යුතු ය යන අදහස නැගෙන්නට කටයුතු සිද්ධ කළේ ය. නගරයේ දකුණු ප්‍රදේශයේ ඇති වූ ගිලා බැසීම්, මුළු නගරය ම අන්ධකාරයට පත් වීම, නගරය පුරා ඉවසිය නොහැකි දුගඳක් පැතිරීම ආදි විපයීාස සිදුවද්දී නගර වැසියන් තුළ නගරයෙන් පලා යා යුතු ය යන අදහස සිතෙහි නැගෙන්නට විය. එහෙත් එය ද ගිලිහී යන්නේ නැවතත් හිරු පායා නගරය යථා තත්ත්වයට පත් වීමෙනි.

කෙසේ වෙතත් අවසානයේ ආයතනවල සේවකයින්, දුප්පත් ජනතාවට කිසිත් කර කියා ගත නොහැකි ව ඒ ඒ තැන්වල ම මිහිදන් වන්නට සිදු විය. නගරයේ ජීවත් වූ ප්‍රභූ පැලැන්තිවල ගිලා බැසීමට පටන් ගත් මොහොතේ ම නගරයෙන් පලා යෑමට උත්සුක වෙයි. අනෙක් මිනිසුන්ට කුමක් වුවත් උන්ට ගාණක් නැත. ශ්‍රී ලාංකේය දේශපාලනයේ සැබෑ පැතිකඩක් හෙළි කරන සමාජ යථාර්ථය පිළිබිඹු කරන ප්‍රමුඛ අවස්ථාවක් ලෙස මේ අවස්ථාව හැඳින්විය හැකි ය.

‘‘ආතර් හා නීනා ද ඇතුළු ව මෙහි පදිංචි ව සිටි ආරක්ෂක අංශවල සහ රජයේ උසස් නිලධාරීන් කල් තියා ම උපක්‍රමශීලී ව පලා ගොස් සිටි බැවින් බොහෝ නිවෙස් පාළුවට ගොස් තිබුණි.’’

කෙසේ වෙතත් මැක්ස් තමා පැමිණි අරමුණ ඉටු කර ගන්නා තෙක් රෙක්ස් සමග නගරයෙහි සිටින්නට විය. දිගු කලක් රෝගාතුර ව සිටි වැංගේ අවසාන කටයුතු සඳහා භූගත ව තිබූ සොහොනට

9 772950 655005

යන මැක්ස් එනතුරු බලා සිටි රෙක්ස් ද පොළෝ තලය මත වැළලී යන්නේ පාඨකයාගේ ඇසට කඳුළක් එක් කරමිනි.

මෙම නවකතාවේ තවත් එක් පැතිකඩක් ලෙස තවමත් එකිනෙකාට නොපැවසූ සුන්දර ආදර කතාවක් ගලා යයි. මැක්ස් හා ලිලී අතර කිසිවකුටත් නොපැවසූ ආදර කතාවක් එහි ගැබ් ව පවතී. මැක්ස් යනු තරුණ වියේ සිටි දේහධාරී කඩවසම් තරුණයෙකි. ඔහුට ද කාන්තාවක් ආකර්ෂණය කර ගැනීමේ හැකියාව පවතී. එසේ ම ලිලී ද එවැන්නියකි. චාත්තු කළා වූ සුන්දර සිරුරක් හිමි ඇය දෙවරක් නොබලා තරුණයෙකුගේ සිත් ඇද ගැනීමට ලක් වන තරුණියකි. ලිලී දුටු දිනයේ පටන් මැක්ස්ගේ සිතෙහි නැඟුණු සිතුවිලි ඒ බව කියාපායි. ඇය හමු වන විට කතාබහ කරන ආකාරයට මැක්ස්ගේ සිත ඇය කෙරෙහි බැඳී ඇති බව පාඨකයාට දැනෙන්නට හරියි. මැක්ස්ට ලිලී ගැන ඇති වන සිතිවිලි අවසානයේ එම ආදරය පුපුරා යන අවස්ථාව මගින් ලිලී ද මැක්ස්ට දැක් වූ ආදරයේ ප්‍රමාණය කියාපායි. එය ආදරය හා රාගය මුසු අවස්ථාවක් ලෙස දැක්විය හැකි ය. එහෙත් එයින් පසු මැක්ස්ගේ සිතේ ලිලී කෙරෙහි ඇති වූ ආදරය ද වැඩි වන්නට විය.

''මැක්ස් ජීවිතයේ කිසි දිනෙක නොදැනුණු තරමේ අසරණභාවයකින් වෙලී පෙළී ගියේ ය. අවසානයේ එයින් මිදෙන්නට උත්සාහ නොකොට, ඒ තුළ ම ගිලී, වැළලී වැනසී ගියේ ය.''

''...මැක්ස්ට එය තදින් ම දැනුණේ මේ වන විට ඔහු ලිලීට මුළු හදින් ම පෙම් කරන්නට පටන් ගෙන තිබූ බැවිනි.''

අදිසි නදිය නවකතාවෙහි එන චරිත පිළිබඳ ව කතා කිරීමේ දී එක් එක් මනුෂ්‍ය ස්වභාවයෙන් යුතු පුද්ගලයින් කිහිප දෙනෙකු පිළිබඳ මෙහි දක්වා ඇත. නවකතාව රසවත් කිරීමට කතුවරයා යොදා ගත් එම චරිත ඉතා විශාල මෙහෙයක් ඉටු කරන බව කිව යුතු ය.

කතාව ආරම්භයේ දී ම මැක්ස්ට හමු වන හොඳ ම යහළුවා වන්නේ රෙක්ස් ය. මුලින් ම මන්ද මානසික පුද්ගලයෙක් ලෙස කතාවේ හඳුන්වන මොහුගේ සැබෑ චරිතය හෙළි වන්නේ මැක්ස් සමග කටයුතු කිරීමේ දී ය. නගරය පිළිබඳ බොහෝ දත්ත සමුදායක් දන්නා ඔහු නගරයේ ගිය නැති අස්සක් මුල්ලක් නැති තරමය. මැක්ස්ගේ අරමුණට ළඟා වීමට රෙක්ස්ගේ උදව්ව බෙහෙවින් බලපෑවේ ය. අවසානයේ ඔහු තම ස්වාමියා වෙනුවෙන් නගරයෙන් පිටට නොයාම භූමියේ ම වැළලෙන්නට වූයේ තම ස්වාමියාට හරි හැටි සේවය කරමිනි. මෙවන් චරිත සමාජයේ දක්නට ලැබෙන්නේ අවම වශයෙනි. තමාගේ මෙන් ම ස්වාමියාගේ ද රහස් රකිමින් ස්වාමියාට හරි හැටි සේවය සපයන්නෙකු ලෙස රෙක්ස් හැඳින්විය හැකි ය.

''එය ගෙවල් දොරවල් ගිල දමමින් වේගයෙන් ඉදිරියට ඇදුනේ ක්‍රම ක්‍රමයෙන් පුළුල් වෙමිනි. වීදිය එක්වර ම දෙබෑ වනු රෙක්ස් දුටුවේ ය. ඔහු එක්වර ම නැගී සිටියේ ය. තමා ඉදිරියේ සැදෙන ගැඹුරු ආවාටය දෙස බලා සිටියේ ය. එය ක්‍රම ක්‍රමයෙන් රෙක්ස් සිටිනා තැනට ද ළං වනු ඇත.''

9 772950 655005

මීළඟට මැක්ස්ට හමු වන තවත් චරිතයක් ලෙස වැං හැඳින්විය හැකි ය. ඔහු මැක්ස්ට හමු වන තවත් හිත හොඳ චරිතයකි. තම පවුලේ රහස් පවා මැක්ස් සමග බෙදා ගනිමින්, පුරාණ පොත්පත්, සිතුවම් ආදිය මැක්ස්ට ලබා දෙමින් මැක්ස්ගේ අරමුණට ළඟා වීමට උදවු උපකාර කළේ ඔහු ය. ඔහුගේ දුව වූ ලිලී නම් චරිතය කතාවට එන්නේ ඉන්පසු ව ය. ඇයගේ පැමිණීම නවකතාවේ රසය තව තවත් ඉස්මතු කරන්නට, පාඨකයා කුතුහලයට ලක් කිරීමට ඉවහල් වූ බව පැවසිය හැකි ය . ලිලීගේ චරිතයක් නොතිබුණේ නම් කතාව මීට වඩා සැහෙන අඩු වන්නට තිබුණි. හොර රහසේ ගලා ගිය ඔවුන්ගේ ප්‍රේමය පාඨකයාට කතාව කියවීමේ රුචිකත්වය තව තවත් වැඩි කිරීමට උත්සුක විය.

මෙම නවකතාවෙහි එන ප්‍රධාන චරිත උක්ත දැක්වූ චරිත වේ. පුරපති, මංගල ආරක්ෂකයින් ආදි චරිත සමාජයේ සිටින දේශපාළුවන්ගේ සහ උගත් වියතුන් යැයි සිතන ප්‍රභූ පැලැන්තිය පිළිබිඹු කරයි. මීට අමතර ව නීනා, ආතර් හා තම නවාතැන්පොළෙහි සිටි සේවකයින්, රෝහලේ සිටි සේවකයින්, බෝබෝ ආදි වූ සුළු චරිත පවා නවකතාවේ රසය තව තවත් තීව්‍ර කරන්නට බෙහෙවින්

ඉවහල් ව ඇත. කතුවරයාගේ එම චරිත නිරූපණ සමාජයේ සිටින සැබෑ මිනිසුන්ගේ ක්‍රියා කලාපය පෙන්නුම් කරයි.

අදිසි නදිය නවකතාවේ මිනිසා විශ්වාස කරන හෝ නොකරන තත්ත්වයේ සිදුවීම් ද දක්නට ලැබේ. එහෙත් එය කතා රසයට බාධාවක් වූවා යැයි සිතිය නොහැකි ය. කතාව ආරම්භයේ දී ම එම නගරයේ ගඟ අසල නිවසක සිදු වූ සිදුවීමක් කතුවරයා දක්වා ඇත. එය පාඨකයා වෙනත් මනෝ ලොවකට ගෙන යන විස්තරයක් විය හැකි ය. එම සිදුවීම් සත්‍යය ද අසත්‍යය ද යන්න පාඨකයා තුළ කුතුහලයක් ඇති කිරීම කතාවෙහි දක්නට ලැබේ. කාන්තාවකගේ සිරුරේ බිම් මල් ඇති වීම, ඒවා පරවී පණුවන් ඇති වීම, ගඟට පැන සිය දිවි හානි කර ගැනීම ආදි සිදුවීම් අභව්‍ය සිදුවීම් ලෙස දැක්විය හැකි ය.

''ඇයගේ කිහිලි හා ඉකිලි අතරින් ද, නාභියෙන් හා ඇඟිලි කරු අතරින් ද, බිම් මල් මතු වී තිබිණි''

''කළු ඇස් ඇති, සුදු පැහැති පණුවන් ශරීරයේ තැන් තැන්වලින් මතු වන්නට විය. නාස් පුඩුවලින් ද, කන් හා ඇස්වලින් ද මහත පණුවන් පිටතට ඇදෙන්නට වූයේ මුරකරු හා ගැහැනිය භීතියට පත් කරමිනි.''

මෙවැනි අභව්‍ය සිදුවීම් කිහිපයක් ම මෙහි දක්නට ලැබේ. එය කතා රසයට බාධාවක් වූවා යැයි සැලකිය නොහැකි ය. කතාව අවසානයේ දී ලිලීට සිදු වන සිදුවීම ද එවැන්නකි.

''ලිලීගේ දෙපා එකට යාවී මත්ස්‍යයෙකුගේ වරලක් සේ දෙපසට වැඩී තිබුණි. දණහිස තෙක් ම මත්ස්‍ය කොරල් දක්නට ලැබුණි. එක්වර ම මැක්ස්ගේ මතකයට නැගුණේ නමක් නැති නගරයේ ඉතිහාසයේ සඳහන් දියකිඳුරි වසංගතය යි.''

9 772950 655005

අවසානයේ ලිලීට ද අත් වූයේ ඉතිහාස කතාවෙහි පැවැති දෙයක් ලෙස පාඨකයාට සිතිය හැකි ය. කෙසේ වෙතත් මෙහි යම් අභිරහස් ස්වභාවයක් ද දක්නට ලැබෙන්නකි. එය ද පාඨක සිත්හි කතාව කියවීමට කැමැත්තක් ඇති කරන්නට ඇත.

මෙම නවකතාවේ භාෂා භාවිතය ගත් කල ව්‍යවහාර භාෂාව භාවිත කර ඇති බව පැහැදිලි වේ. එසේ ම වාර්තාමය ස්වරූපයෙන් නො ව, සංවාදශීලී ලෙස විවාදාත්මක භාෂාව යොදා ගනිමින් පාඨකයා නවකතාව කියවීමෙහි ලා ඇද බැඳ තබා ගැනීමට හැකි අයුරින් භාෂාව භාවිත කර ඇති බව පෙනෙයි. සමහර නවකතා මෙන් නො ව, නවකතාවේ මීළඟට කුමක් වේ දැයි නොඉවසිල්ලෙන් කියවිය හැකි අයුරින් කතාව නිර්මාණය කොට තිබේ. කතාව ආරම්භයේ සිට ම පාඨකයා කුතුහලයට ලක් කරමින් මැක්ස්ගේ චරිතය මනා ව ගොඩ නඟන්නට කතුවරයා සමත් වී ඇත.

“සේවක පිරිස් අතර, මැක්ස් පිළිබඳ නොයෙක් නිගමන ඇති විය. වැඩි දෙනා සිතුවේ ඔහු රහස් පරීක්ෂකයෙකු බව ය. නොඑසේ නම්, ආදරයේ කිසියම් දූෂණ කටයුත්තක් සෙවීම් පිළිබඳ ව පැමිණි රජයේ උසස් නිලධාරියෙකි. බාර්මන් පමණක් මැක්ස් කිසියම් අපරාධයකට අර දෙන්නකු බවට සැක කළේ ය. එහෙත් අනිත් අය ඊට එකඟ වූයේ නැත.’’

මීට අමතර ව නවකතාවෙහි සංවාදශීලී යෙදුම් බෙහෙවින් දක්නට ලැබේ.

“මොකද වෙලා තියෙන්නෙ?”

“ෆිට් එක හැදුණා. මිනිහට ඉඳහිට ඔහොම වෙනවා.”

“ඉස්පිරිතාලෙකට ගෙනියන්නෙ නැද්ද?”

“සමහර වෙලාවට ඉබේට ම හරි යනවා.”

ඒ ආකාරයෙන් පාඨකයා නවකතාව කෙරෙහි ඇද බැඳ තබා ගනිමින් කථාව කියවන්නට පාඨකයාට ඇති රුචිකත්වය වර්ධනය කරමින් කතාව ගලා යන්නට කතුවරයා සලස්වයි. කපිල කුමාර කාලිංග විසින් **අදිසි නදිය** නවකතාවෙහි භාවිත කරන ලද භාෂා භාවිතයේ විශේෂ ලක්ෂණයක් ලෙස නව්‍ය උපමා භාවිතය දැක්විය හැකි ය. කතුවරයා නව්‍ය උපමා භාවිත කළ ද සමහර ඒවා අවස්ථාවට උචිත වන්නේ දැයි නැගෙන්නේ පැනයකි.

“ලිලීගේ සිරුර උපරිමයට රත්ව දුම් නගින ස්ත්‍රියක් මෙන්, මැක්ස්ගේ ගතෙහි දැවටෙයි.’’

“ඇගේ මුහුණ පළිඟු රෝස පැහැයක් ගත්ත ද අත් පා කිරිගරුඬ මෙන් විය.’’

“ඇගේ සිරුර ලැමිනේට් ආවරණයක් යෙදුවක් මෙන් දිලිසෙන බවකි.’’

මෙහි දී ‘ලැමිනේට්’ ආදි උපමා අවස්ථාවට උචිත වේ දැයි සිතන්නට සිදුවන්නකි. කෙසේ වෙතත් නව්‍ය උපමා භාවිත කිරීම අගය කළ යුත්තකි.

9 772950 655005

සමස්තයක් ලෙස ගත් කල මෙම නවකතාව අභිරහස් නවකතාවක් ලෙස පෙනුණ ද ඉන් එහා ගිය සමාජ යථාර්ථයක් පිළිබිඹු කරන්නක් ලෙස හඳුනා ගත හැකි ය. මතුපිටින් ගංගාවේ අබිරහස දිග හැරුණ ද එහි යට බහාලූ සමාජ පැතිකඩ නම් වර්තමාන ලාංකේය දේශපාලනයේ හෙළුව විවරණය කිරීම යි. පුහු මාන්නෙන් හිස උදුම්මවා ගත් උගත් බුද්ධිමත් යැයි සිතන ප්‍රභූන්ගේ පහත් ක්‍රියාකාරකම්, අවස්ථාවාදී සිදුවීම්, පාලකයන් ගැටලුවලට ගන්නා මෝඩ තීන්දු තීරණ සරදමට ලක් කරමින් පාඨකයා ඉදිරියේ චිත්‍රණය කරන්නට කතුවරයා සමත් වී තිබේ. එසේ ම සියුම් ව ගලා යන මැක්ස්ගේ හා ලිලීගේ ප්‍රේම වෘතාන්තය දිග හැරේ. සරල ව්‍යවහාර භාෂාව යොදා ගනිමින් සංවාදශීලී අවස්ථා යෙදීමෙන් පාඨකයා නවකතාව කෙරෙහි ඇද බැඳ තබා ගන්නට සමත් වේ. නව්‍ය උපමා භාවිත කිරීමත් එම නවකතාවේ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයකි. නවකතාවෙහි චරිත යොදා ගනිමින් මැනවින් චරිත නිරූපණය කිරීම ද කතා රසය වැඩි වීමට හේතු වන්නට ඇත.

එන්.ටී.සී.එස්. ෆොන්සේකා
සිව්වන වසර
සිංහල අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය
chaturikafonseka111@gmail.com

9 772950 655005